සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2024 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2024-02-18
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්,*** ***එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.1 පහත සඳහන් ඒවා අතුරෙන්, කේවලස්වාමි ව්‍යාපාරයක අවාසියක් වන්නේ කුමක් ද?

(1) පහසුවෙන් ආරම්භ කිරීමට හැකිවීම.
(2) ඉක්මන් තීරණ ගැනීමේ හැකියාව.
(3) වගකීම අසීමිත වීම.
(4) නීති සහ රෙගුලාසි අවම වීම.

1.2 පහත සඳහන් ඒවා අතුරෙන්, සංවිධානයක ප්‍රධාන මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) පුද්ගල කණ්ඩායමක් සිටීම.
(2) පොදු අරමුණක් තිබීම.
(3) ව්‍යුහයක් තිබීම.
(4) ලිඛිත ගිවිසුමක් තිබීම.

1.3 මුදල් වෙළෙඳපොළ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) එය කෙටිකාලීන අරමුදල් සඳහාම වූ වෙළෙඳපොළක් වේ.
(2) එහි ගනුදෙනු සිදුකරනු ලබන්නේ කොළඹ කොටස් වෙළෙඳපොළ තුළය.
(3) මුදල් වෙළෙඳපොළේ ප්‍රධාන උපකරණ වන්නේ කොටස් සහ ණයකරයි.
(4) ප්‍රාථමික වෙළෙඳපොළ සහ ද්විතීයික වෙළෙඳපොළ වශයෙන් එය උප කොටස් දෙකකින් යුක්ත වේ.

1.4 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකයෙකු සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) ඔහු / ඇය ව්‍යාපාරයේ සේවකයෙකු වේ.

(2) ඔහු / ඇය සම්ප්‍රදායික ලෙස සිතන පුද්ගලයෙකු වේ.

(3) ඔහු / ඇය නව ව්‍යාපාරික අවස්ථා පිළිබඳ අවධානය යොමු කරයි.

(4) ඔහුට / ඇයට අවදානම කළමනාකරණය කළ නොහැකය.

1.5 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක් විසින් භාවිත කරනු ලබන බෙදාහැරීමේ මාධ්‍යය තීරණය කරනු ලබන සාධකයක් වන්නේ කුමක් ද?

(1) නිෂ්පාදිතයේ ස්වභාවය. (2) පිරිවැය.

(3) දුර ප්‍රමාණය. (4) ඉහත සඳහන් සියල්ලම.

1.6 වාණිජ බැංකුවල ජංගම ගිණුම්වල ඇති ශේෂයන් හඳුන්වනු ලබන්නේ:

(1) බැංකු මුදල් ලෙසයි. (2) ආසන්න මුදල් ලෙසයි.

(3) ගම්‍ය (implicit) මුදල් ලෙසයි. (4) විද්‍යුත් මුදල් ලෙසයි.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, වාණිජ බැංකුවක කාර්යයක් **නොවන්නේ** කුමක් ද?

(1) ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම. (2) කල්බදු පහසුකම් සැපයීම.

(3) අයිරා පහසුකම් සැපයීම. (4) තැන්පතු බාර ගැනීම.

1.8 පහත සඳහන් ප්‍රකාශ සළකා බලන්න:

(a) රට තුළ රැකියා අවස්ථා නිර්මාණය කිරීම.

(b) රටේ දළ දේශීය නිෂ්පාදිතයට දායක වීම.

(c) අපනයන වෙළෙඳපොළ තුළ විශාල කොටසක් නියෝජනය කිරීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්හි (SMEs) වැදගත්කම වනුයේ:

(1) (a) සහ (b) පමණි. (2) (a) සහ (c) පමණි.

(3) (b) සහ (c) පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.9 පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක ආසන්න පරිසරයේ (task environment) බලවේගයක් **නොවන්නේ** කුමක් ද?

(1) පාරිභෝගිකයින්. (2) තරඟකරුවන්. (3) ආර්ථික පරිසරය. (4) සැපයුම්කරුවන්.

1.10 පහත සඳහන් ඒවා අතුරෙන්, හොඳ ප්‍රවාහන පද්ධතියක සාධකයක් **නොවන්නේ** කුමක් ද?

(1) වේගය. (2) අධික පිරිවැය. (3) ධාරිතාවය. (4) ආරක්ෂාව.

*අංක **1.11** සිට **1.15** දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය හෝ අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 බද්ධ ව්‍යාපාරයක් (joint venture) සඳහා ලියාපදිංචිය අවශ්‍ය වේ.

1.12 අවිනිශ්චිතතාවයට මුහුණ දීම, ව්‍යවසායකත්වය වේ.

1.13 රැකියාවන්හි සමානාත්මතාව ආරක්ෂා කිරීම, සේවකයින් කෙරෙහි ආයතනික සමාජ වගකීම [Corporate Social Responsibility (CSR)] ඉටුකිරීම සඳහා ව්‍යාපාරයක් විසින් ගනු ලබන ක්‍රියාවකි.

1.14 සමාගමක කොටස් හෝ ණයකර මිලදී ගැනීම සඳහා මහජනතාව වෙත ආරාධනා කරනු ලබන ලියවිල්ල, කොටස් බලපත්‍රය (share warrant) ලෙස හැඳින් වේ.

1.15 නිපුණතා හිඟතාවය, දුර්වල කළමනාකරණ පිළිවෙත් සහ සීමිත ශ්‍රම බලකා පුහුණුව, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් [Small and Medium Size Enterprises (SMEs.)] මුහුණ දෙනු ලබන අභියෝගයන් වේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 මුදලේ කාර්යයක් වශයෙන් "වටිනාකම මැනීමේ මිනුමක් ලෙස කටයුතු කිරීම" කෙටියෙන් පැහැදිලි කරන්න.

1.17 රක්ෂණයේදී "උපරිම විශ්වාසය (Utmost Good Faith)" යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

1.18 කාන්තා ව්‍යවසායකත්වය මුහුණපාන අභියෝග දෙකක්(02) සඳහන් කරන්න.

1.19 ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ස්ථාපිතකොට ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිලාභ දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.20 කොළඹ කොටස් වෙළෙඳපොළේ කාර්යයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## <u>B කොටස</u>

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**සුනිල්** සහ **නිමල්** ඹිලුගම ප්‍රදේශයේ පදිංචිව සිටින අතර, එම පළාතේ අඹ වගාව සාර්ථකව සිදුකරනු ලබයි. **සුනිල්** සහ **නිමල්** අඹ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරන ලදී. ඒ අනුව, ඔවුන් විසින් ඹිලුගම ප්‍රදේශයෙන් අඹ මිලදීගෙන තොග වෙළදාම සඳහා ඒවා කොළඹට ප්‍රවාහනය කරන ලබයි. මෙම ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් ලෙස **S & N එන්ටර්ප්‍රයිසස්** නමින් කරගෙන යාමට ඔවුන් සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හවුල් ව්‍යාපාරයක ලක්ෂණ හතරක්(04) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) හවුල් ව්‍යාපාරයක ඇති අවාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) හවුල්කරුවෙකුගේ යුතුකම් (duties) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **03** වන ප්‍රශ්නය

**ශ්‍රීදේව** විසින් තලවකැලේ ප්‍රදේශයේ පිහිටි කුඩා පරිමාණ තේ කර්මාන්තශාලාවක් අත්පත් කරගන්නා ලදි. යුරෝපීය වෙළෙඳපොළ සඳහා නව තේ නිෂ්පාදිතයක් නිපදවීම සඳහා මෙම කර්මාන්තශාලාව පරිවර්තනය කිරීමට ඔහු තීරණය කරන ලදි. එම අදහසින්, ඔහු විසින් අපනයන වෙළෙඳපොළ සඳහා වෙනස් රසයෙන් යුත් උසස් තත්ත්වයේ ක්ෂණික තේ කොළ නිෂ්පාදනය කිරීමට සම්පූර්ණ ක්‍රියාවලියම ස්වයංකයව සිදුකිරීමට හැකිවන ලෙස කර්මාන්තශාලාව පරිවර්තනය කරන ලදි. තම ව්‍යාපාරය සුමටව පවත්වාගෙන යාමට සහ වර්ධනය කරගැනීම සඳහා හොඳ පවාහන සේවාවක් තිබීම අත්‍යාවශ්‍ය බව **ශ්‍රීදේවගේ** විශ්වාසය වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) යුරෝපීය වෙළෙඳපොළෙ තේ අපනයනකරුවෙකු ලෙස **ශ්‍රීදේවට** හොඳ ප්‍රවාහන සේවාවක් තිබීමේ වාසි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) **ශ්‍රීදේවගේ** ව්‍යාපාරයට නව තාක්ෂණය යොදාගැනීමේ වාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) විදේශ වෙළදාමේදී භාවිත වන ලියවිලි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**සුබෝධ,** ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදන සමාගමක් වන **සීමාසහිත XYZ සමාගමේ** ප්‍රධාන ගණකාධිකාරිවරයාය. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි **සුබෝධ** විසින් ඔවුන්ගේ කර්මාන්තශාලා සේවකයින් සඳහා යෝග්‍ය රක්ෂණ ඔප්පුවක් පිළිබඳව අධ්‍යයනය කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කර්මාන්තශාලා සේවකයින් සඳහා රක්ෂණ ආවරණයක් පැවතීමෙන් **සීමාසහිත XYZ සමාගමට** ලැබෙන වාසි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) කර්මාන්තශාලා සේවකයින්ගේ රක්ෂණ ආවරණය සම්බන්ධයෙන් "රක්ෂ්‍ය හිමිකම" යන පදය **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) රක්ෂණය, අවදානමක් ලෙස පිළිගැනීමට භාවිත කරන නිර්ණායක තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

ක්‍රීඩා උපකරණ ආනයනය කරනු ලබන **සුමල් එන්ටර්ප්‍රයිසස්** හි ප්‍රධාන ශාඛාව කොළඹ කෙලින් වීදියේ පිහිටා ඇත. එය තොග වෙළෙඳ ව්‍යාපාර කටයුතුවල යෙදී සිටින අතර, ඔවුන්ගේ පාරිභෝගිකයින් රටේ විවිධ ප්‍රදේශවල සිටී. ගනුදෙනුකරුවන් රඳවා ගැනීමේ උපක්‍රමයක් ලෙස ව්‍යාපාරයේ හිමිකරු වන **සුමල් මෙන්ඩිස්** විසින් සමහර පාරිභෝගිකයින් ට ණයපත් (credit cards) සහ චෙක්පත් මගින් ගෙවීම් කිරීමට ඉඩ සලසා ඇත. තවද, ඔහු අන්තර්ජාල බැංකු පහසුකම් සඳහා තම බැංකුව සමග ලියාපදිංචි වීමට සැලසුම් කරයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) හොඳ මුදලක ලක්ෂණ හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(b) (i) ණයපත් හැරුණු විට, විද්‍යුත් මුදල් සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(ii) අන්තර්ජාල බැංකු පහසුකම් භාවිතයෙන් සිදුකළ හැකි සේවාවන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(c) චෙක්පතක මූලිකාංග හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගම,** නවතම සහ පාවිච්චි කරන ලද වාහන විකිණීමේ නිරත වන අතර, මෝටර් රථ අලෙවි ස්ථාන වශයෙන් ශාඛාවන් හතරක් කොළඹ, කළුතර, මහනුවර සහ දෙහිවල පිහිටුවා ඇත. **අතුල සිරිවර්ධන** විසින් මෙම ව්‍යාපාරය මීට දශක හතරකට පෙර කේවලස්වාමි ව්‍යාපාරයක් වශයෙන් ආරම්භ කරන ලදී. එම කාලයේදී ඔහු සතුවූයේ දෙහිවල මෝටර් රථ අලෙවි සැල පමණි. පසුව, **අතුල** තම බිරිඳ, පුතා සහ ඔහුව අධ්‍යක්ෂකවරුන් ලෙස පත්කර ගනිමින් තම ව්‍යාපාරය, වගකීම සීමිත පෞද්ගලික සමාගමක් ලෙස සංස්ථාපනය කරන ලදී. ඒ සමඟින් **සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගමට** මූල්‍ය ආයතන කිපයකින් ණය ප්‍රාග්ධනය ලබාගැනීමට හැකියාව ලැබුණි. තවද, සමාගම විසින් ඔවුන්ගේ පාරිභෝගිකයින් හට කල්බදු පහසුකම් සැපයීම සඳහා කල්බදු සමාගම් දෙකක් සමඟින් ගිවිසුම්ගත විය.

පසුගිය වසර තුනක කාලය තුළ, කොවිඩ්-19 වසංගතය, පාස්කු ප්‍රහාරය සහ රටතුළ පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් පැන නැගුනු ආර්ථික අර්බුධය නිසා ඔවුන්ට විවිධ වූ ගැටළුවලට මුහුණ පෑමට සිදුවිය. 2020 මාර්තු මාසයේදී රජය විසින් සියලුම වාහන ආනයන තහනම් කරන ලදී. මේ නිසා රටතුළ පැවති පාවිච්චි කරන ලද වාහනවල මිල ගණන් 100% කින් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. ජීවන වියදම ඉහළ යාමත් සමඟ, **සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගමේ** මෝටර් රථ අලෙවියේ සීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබුණි. මූල්‍ය ආයතන විසින් ලබාදුන් ණය පහසුකම් නැවත ප්‍රතිව්‍යුහගතකරන ලෙස එම ආයතනවලින් ඉල්ලා සිටීමට **අතුලට** සිදුවිය. සියලුම මෝටර් රථ අලෙවි මධ්‍යස්ථානවල සේවක සංඛ්‍යාව අඩුකල අතර, කිසිඳු මෝටර් රථ මධ්‍යස්ථානයක "විකුණුම් නොමැති" තත්ත්වය තුළ මාස කිපයක්ම ඉතිරි සේවකයින්ගේ වැටුප් **අතුලගේ** පෞද්ගලික ඉතුරුම්වලින් ගෙවා දමන ලදී.

සමාගම පවත්වාගෙන යාමේ උපායමාර්ගයක් ලෙස, සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ද වන **අතුල සිරිවර්ධනගේ** පුත් **ශාතක** විසින් "වාහනවල ව්‍යුහය වෙනස් කිරීමේ" (Vehicle Re-modeling) ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ අදහස ඉදිරිපත් කරන ලදී. වාහන මාරු කිරීමට අවශ්‍ය නමුත් ආනයන සීමාකිරීම හේතුවෙන් නව වාහනයක් මිලදී ගැනීමට නොහැකි සහ ආර්ථික අර්බුධය හේතුවෙන් ප්‍රමාණවත් මුදලක් නොමැති වාහන හිමිකරුවන් සමාගම විසින් ඉලක්කකොට ඇත. **ශාතකගේ** නිර්මාණාත්මක අදහස් සමඟින් ව්‍යාපාරය පවත්වාගෙන යාමේ උපක්‍රමය ඉතා සාර්ථක වූ අතර, කුඩා පරිමාණ මෝටර් රථ ඉංජිනේරු සමාගම් සමඟ **ශාතක** ට පැවති සම්බන්ධතා හේතුවෙන් ඔවුන්ට අවශ්‍ය කුසලතා, විශේෂඥ දැනුම හා අවශ්‍ය අමතර කොටස සහ උපාංග සඳහා පහසුවෙන් ප්‍රවේශ වීමට හැකිවිය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගමට,** සංස්ථාපිත සමාගමක් ලෙස භුක්ති විඳිය හැකි වාසි හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) PESTEL විශ්ලේෂණය භාවිතයෙන්, **සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගමේ** ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(c) සංවිධානයක් විසින් එහි ඇල්මැති පාර්ශවයන්ට ඇති වගකීම් සපුරාලිය යුත්තේ ඇයිද යන්නට හේතු තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(d) රජය විසින් ව්‍යාපාර සඳහා බලපෑම් කරන ආකාර තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(e) **සීමාසහිත සිරි මෝටර් හවස් (පෞද්ගලික) සමාගමේ** ව්‍යාපාර සාර්ථකත්වයට "නිර්මාණශීලීත්වය" කෙසේ උපකාර වන්නේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනඟා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |